


අපි තවත්
තීරණාත්මක
මැතිවරණයක
මුව විටට
පැමිණ
සිටින්නෙමු.

සාධාරණ වූ
හෝ අසාධාරණ වූ හෝ මැතිවරණ ක්‍රියාවලියකින් පසුව කවුරුන් හෝ කෙනෙකු මේ තරගයෙන් ජය ගනු ඇත. එදායින් පසු මේ මැතිවරණ කාලය තුළ ටොන් ගණන් වැපිරූ සුන්දර පොරොන්දු වලට සිදුවන්නේ කුමක්දැයි කියන්නට දන්නේ දෙවියන් පමණි. මැතිවරණ පොරොන්දු හිස් වචන බවටත් ප්‍රතිපත්ති ප්‍රකාශණ නිකම්ම කඩදාසි බවටත් පත් වනු ඇත.

මහජනතාව සුපුරුදු දුක්ඛ දෝමනස්සයන් තුරුළු කරගෙන ජීවන සටනට අවතීර්ණ වනු ඇත. උන් ගැන සොයන්නට දිනූ අයටත් පැරදුන අයටත් නැවතත් සිහිපත් වන්නේ ඊළඟ මැතිවරණය එන දාට ය.

ඉක්මනින් තවත් මැතිවරණයක් පැමිණේවා යි අප පතන්නේ එහෙයිනි.

ගිය මාසයේ කවරයේ මුරලි හා සංගක්කාරගේ ඡායාරූප
**වර්නන් තිසේරා ගේ**
බව කරුණාවෙන් සළකන්න

ශ්‍රී ලාංකික
ඇට මිදුළු
දායක ලේඛණයේ
ලියාපදිංචි
දායකයින් ගණන




**ඇට මිදුළු/සම්භව සෛල දායකයකු ලෙස ලියාපදිංචි වන්න**

ජීවිතයක් කොයි තරම් වටිනවද..?

**ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමූහික ප්‍රයත්නයක්**



# මහින්දට එරෙහිව
## කොබ්බෑකඩුව ඔපරේෂන් නව මුහුණුවරකින්
### ජනාධිපතිවරණයෙන් මහින්ද දිනයිද?

**අනුර හොරේෂස්**

මහින්දට එරෙරහිව කොබ්බෑකඩුව ඔපරේෂන් නව මුහුණුවරකින් ජනාධිපතිවරණයෙන් මහින්ද දිනයිද?

මොකෝ නැතුව... අනිවාර්යයෙන්ම මහින්ද රාජපක්ෂ මහත්තයා ජනධිපතිවරණයෙන් දිනනවා. ජනාධිපතිවරණයෙන් දිනන්නත් ඕනෑ මහින්ද මයි... ඒකේ දෙකක් නෑ... රටේ බහුතරයක් හිතන්නේ එහෙමයි.

හැබැයි ජනධිපතිවරණ ජයග්‍රහණය මහින්ද මහත්තයා අත්පත් කරගන්නේ ලෙහෙසියට පහසුවට නෙවෙයි. මාර යුද්ධයක් කරලා. .. මාර සටනක් දීලා.

මතුපිටින් පේන්න තියෙන්නෙ මහින්ද මහත්තයා ඉතා පහසුවෙන් ජනපතිවරණ සටන ජයගන්නා බවකුයි.. ජනතා විමුක්ති පෙරමුණේ දූවැන්ත සහයෝගයත් එක්ක විවෘත ආර්ථිකයට නැවතීමේ ළකුණ තබන මහින්දගේ ප්‍රතිඥාත් සමග මහින්ද මහත්තයා අත උඩින් ගහන බවකුයි පේන්න තියෙන්නෙ. හැබැයි ඒක යථාර්ථය නෙවෙයි. ඒ තමයි මායාව. මායාවෙන් අපේ ඇස් වැහෙන්න දෙන්න නරකයි. එතකොට මොලෙත් අවුල් වෙනවා. ඒ නිසා මායාව සහ යථාර්ථය අපි වටහා ගන්න ඕනෑ.

ජනධිපතිවරණ දිනය තවත් ළඟ වෙන කොට මොන විදිහේ දේශපාලන කුණාටු මහින්දට එරෙහිව හමාවිද යන්න දූන්ම කියන්න බැහැ. ඒත් දූන් ටිකෙන් ටික චණ්ඩ සුළං හමන්න පටන් ගෙන තිබෙන බවකුයි පෙනෙන්නෙ. මහින්දට විරුද්ධව එජාපයෙන් හමන දේශපාලන කුණාටු සාමාන්‍ය දෙයක්. එජාප ජනධිපති අපේක්ෂක රනිල් මහත්තයාගේ ජයග්‍රහණය පතා එහි ප්‍රබලයන් මහින්දට එරෙහිව හෙල්පින් හම්බන්තොට වැනි මුදල් වංචා චෝදනා ඉදිරිපත් කළේ ඒ නිසා.

ඒ වගේ චෝදනා වලින් මහින්ද රාජපක්ෂ වැනි අයෙකුගේ කීර්ති නාමයට මදි පුංචි කමක් කරන්න බැරි බව එජාපයට තේරුම් ගියේ පස්සෙ. ඒ කියන්නෙ හෙල්පින් හම්බන්තොට සිද්ධිය ගැන ජනතාව අතරේ කිසිම උනන්දුවක් උණුසුමක් සංවාදයක් සාකච්ඡාවක් ඇති වුණේ නැති නිසා.

ඒ හන්දා ඌරාගේ මාලු ඌරාගේ ඇඟේම තබා කපන න්‍යායට එජාපය පැමිණියා. ඒ බාරදූර වැඩේ බාර වුණේ පොදු පෙරමුණෙන් එජාපයට පැන්න මහින්ද විජේසේකරට. මහින්ද විජේසේකර කියන්නේ පොදු පෙරමුණේ සිටියදීත් මහින්ද රාජපක්ෂට විරුද්ධව අවි අමෝරාගත් මාතර දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙක්. එයා දන්නවා ජනධිපතිවරණ සටනේදී මහින්දව අඩපණ කරන්න නම් අනින්න හොඳ නිලය මොකක්ද කියලා.

මොකක්ද මේ නිලය.? ඒ තමයි අනුර බණ්ඩාරනායක. කවුරු කෑ ගැහුවත් ජනාධිපති අපේක්සකයා මමයි කියා පාරම් බෑ අනුර මහත්තයාගේ කට ටිකක් අවුස්සා ගත්තොත් මහින්ද රාජපක්ෂ ජනධිපති අපේක්ෂකයාට ඇට්ටි හැලෙන්න ශ්‍රීලංනිපයේ අනුර බණ්ඩාරනායක අගමැති අපේක්ෂකයා නෙලන බව මහින්ද විජේසේකර දන්නවා.

ඒ නිසා මහින්ද විජේසේකර ජනධිපතිවරණ සටන පටන් ගෙන සතියක් දෙකක් යද්දී ජාතික පුවත් පතකට පිටුවක් පිරෙන්න සම්මුඛ සාකච්ඡාවක් දුන්නා. ඒ සාකච්ඡාවෙදි ඔහු මෙන්න මෙහෙම කිව්වා.

“මහින්ද රාජපක්ෂ කියන්නේ සුනාමි ආධාර රුපියල් කෝටි ගාණක් වංචා කළ පුද්ගලයෙක්. මේ ආධාර මහින්ද රාජපක්ෂ අගමැතිතුමා දැම්මේ එයාගෙ පෞද්ගලික ගිනුමකට. ඒ තමයි හෙල්පින් හම්බන්තොට. මේ වගේ වංචාකරුවෙක් තමයි ජනධිපති අපේක්ෂකයා හැටියට පොදු පෙරමුණෙන් ඉදිරිපත් කළේ. **හරි නම් නියම සුදුස්සා අනුර බණ්ඩාරනායක මහත්තයා. මම දන්න තරමට අනුර බණ්ඩාරනායකලා මුදල් වංචා කරලා නැහැ. ජනතාවගේ මුදල් වංචා කරලා නැහැ..“**

අනුර බණ්ඩාරනායක මහත්තයා මේ වෙනකොට ඉන්නේ පින් එක ගලවාපු ග්‍රෙනේඩ් බෝම්බයක් වගේ. පුපුරන්න ඔන්න මෙන්න. මීට ඉස්සෙල්ලක් අනුර හෙක්ටර් කොබ්බෑකඩුව ජනාධිපති අපේක්ෂක තුමාට නැගිටින්න බැරි වෙන්නම ගැහුවා. ඒ නුගේගොඩ රැස්වීමෙදි. දස දහස් ගණනින් රැස් කකා හිටපු ජනතාවක් ඉදිරිපිට තිබූ වේදිකාවට ගොඩ වුණ අනුර මහත්තයා කටේ දිග පළල ඇරලා මෙන්න මෙහෙම කිව්වා.

*“හෙක්ටර් කොබ්බෑකඩුව ජනධිපති අප්ක්ෂකතුමාට අපේ අම්මා දීලා තියෙන්නෙ කොන්ත්‍රාත්තුවක්. ජනධිපතිවරණයෙන් පස්සේ ඒ කොන්ත්‍රාත්තුව ඉවරයි.“* ඒ වෙනකොට විජය කුමාරණතුංගගේ ශ්‍රී ලංකා මහජන පක්ෂය වටා ලක්ෂ

4 වන පිටට

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0439 925 241

**SA**
Chandta Eeriyagama
08 8331 2318

**TAS**
Anura Seneviratne
03 6327 4259

**සන්නස පිරිවර**

| | |
|---|---|
| අනුර හොරේෂස් | Anura Horetious |
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| අසෝක සුබසිංහ | Asoka Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |
| ඩබ් ක ධර්මබන්ධු | W. K. Dharmabandhu |
| ආචාර්ය විද්‍යානි මනතුංග | Dr Vidyani Manathunga |
| චන්දි මාපා | Chandi Mapa |
| ශ්‍රියාණි මද්දුමගේ | Sriyani Maddumage |
| මහින්ද දිසානායක දිවුල්ගනේ | Mahinda Dissanayaka Diwulgane |

සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සන්නස** SANNASA
අපේ උරුමය වෙනුවෙන්

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**බෙදාහැරීම් සහය**
ප්‍රියන්ත පෙරේරා

**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel : 03 9310 4196 /0425 720 932
Fax : 03 9310 5569